## 3. මූලික සන්නිවේදන වර්ග, ස්වරූප හා ආකෘති

**නිපුණතාව** : **3.0** සන්නිවේදන වර්ග, ස්වරූප හා ආකෘති පිළිබඳ න්‍යායාත්මක කරුණු අවබෝධ කර ගනිමින් ඒවා අවස්ථෝචිත ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 3.1 සන්නිවේදන වර්ග පිළිබඳ අවබෝධ කර ගනිමින් අවස්ථානුකූල ව භාවිත කරයි.

**කාලච්ඡේද** : 30 යි.

**ඉගෙනුම් පල** :

- සන්නිවේදන වර්ග නම් කරයි.
- සන්නිවේදන වර්ග වෙන් වෙන් වශයෙන් නම් කරයි.
- සන්නිවේදන වර්ග පිළිබඳ න්‍යායාත්මක කරුණු ප්‍රායෝගික ව භාවිත කිරීමෙන් සන්නිවේදනය සාර්ථක කර ගැනීමට හැකි වන බව පිළිගෙන කටයුතු කරයි.
- අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයේ ස්වභාවය හා ක්‍රියාවලිය විග්‍රහ කරයි.
- අන්තර්පුද්ගල සන්නිවේදනය යන්න පැහැදිලි කරයි.
- ආචාරශීලී ව අන්තර්පුද්ගල සන්නිවේදනයේ යෙදෙයි.
- වගකීම හා වගවීමෙන් යුතු ව සමූහ සන්නිවේදනයේ යෙදීමේ අවශ්‍යතාව හඳුනා ගනිමින් ඒ අනුව කටයුතු කරයි.
- සමූහ සන්නිවේදනයේ ස්වභාවය හා එහි විශේෂතා හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- සමූහ සන්නිවේදනය යන්න හඳුනා ගනිමින් ඒ අනුව කටයුතු කරයි.
- මහජන සන්නිවේදනය යන්න පැහැදිලි කරයි.
- ජන සන්නිවේදනය යනු කුමක් ද යි විග්‍රහ කරයි.
- අතථ්‍ය සන්නිවේදනයේ ස්වභාවය හා ක්‍රියාවලිය හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- සන්නිවේදන වර්ගයන්හි ප්‍රායෝගික අවශ්‍යතාව හා ඵලදායිත්වය විග්‍රහ කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්:**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න.

**සන්නිවේදන වර්ග**

1. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය (Intrapersonal Communication)
2. අන්තර්පුද්ගල සන්නිවේදනය (Interpersonal Communication)
3. සමූහ සන්නිවේදනය (Group Communication)
4. මහජන සන්නිවේදනය (Public Communication)
5. ජන සන්නිවේදනය (Mass Communication)
6. අතථ්‍ය සන්නිවේදනය (Virtual Communication)

- සන්නිවේදන වර්ග යන්නට ඉංග්‍රීසි භාෂාවේ 'Types of Communication' ලෙස භාවිත වේ.

1. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය (Intrapersonal Communication)

- තමා තමා සමඟ ම සිදු කරනු ලබන සන්නිවේදනය අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය යි. සෑම පුද්ගලයකු ම තම මනස හා සම්බන්ධ වෙමින් සන්නිවේදනයේ යෙදෙයි.

- අපගේ පංච ඉන්ද්‍රියයන් වන ඇස, කන, නාසය, දිව, සම යන ඉන්ද්‍රියයනට දැනෙන රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන උත්තේජනයන්ට ප්‍රතික්‍රියා දැක්වීම මෙහි දී ප්‍රධාන වේ.

- පුද්ගල මනෝභාවයන්, පෞද්ගලික අත්දැකීම්, පෞද්ගලික අවශ්‍යතා හා සංකල්ප තමන් විසින් ම තමන් තුළ විමර්ශනයට ලක් කිරීම මෙහි දී සිදු වේ.

- විවිධාකාර මූලාශ්‍රයයන් හරහා අප වෙත ලැබෙන්නා වූ තොරතුරු පදනම් කරගෙන අප තුළ ම සංවාදයක් ගොඩ නැගේ. මෙය සිදු වන්නේ අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය මඟිනි. එය තීරණ ගැනීමට පුද්ගලයාට ඉවහල් වේ.

- ස්ව සංකල්පය ගොඩ නැගීමට අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය උපකාර වේ.
- තම මනස අභ්‍යන්තරයේ සිදු වන සන්නිවේදනයක් බැවින් බහු පුද්ගල සබඳතාවක් දක්නට නොලැබේ.

- අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයේ දී පුද්ගල ස්මෘතික ශක්තිය වැදගත් වේ.
- සංජානනය අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයේ මූලිකාංගයකි.
- අතැම් අවස්ථාවල දී අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය, පුද්ගල චර්යා හා ඉරියව්වලින් දැනගත හැකි වේ.

- අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයේ ප්‍රයෝජන කිහිපයක් පහතින් දැක්වේ.

  1. පෞරුෂ වර්ධනයට
  2. ස්ව සංකල්ප පෝෂණයට
  3. චින්තනය ගොඩ නංවා ගැනීමට
  4. මතක තබා ගැනීම සඳහා
  5. තීරණ ගැනීමට
  6. විචාරශීලීත්වය වර්ධනය කර ගැනීමට
  7. නිර්මාණශීලීත්වය ඔප් නංවා ගැනීමට

2. **අන්තර්පුද්ගල සන්නිවේදනය** (Interpersonal Communication)

- අන්තර්පුද්ගල සන්නිවේදනය යනු පුද්ගලයන් දෙදෙනෙකු හෝ කිහිප දෙනෙකු අතර සන්දේශ හුවමාරු කර ගැනීමයි. (Defleur and Dennis, 2002)

- පුද්ගලයන් දෙදෙනෙකු හෝ වැඩි දෙනෙකු අතර සිදුවන තොරතුරු හුවමාරුව අන්තර්පුද්ගල සන්නිවේදනය යි. (Berger,Charles. R., 2008)

- අන්තර්පුද්ගල සන්නිවේදනය කිහිප දෙනෙකු අතර සිදු වීමේ දී ඒ අතර සිටින දෙදෙනෙකු අතර වුව ද සන්නිවේදනයක් සිදු විය හැකි ය. එය යුගල (dyadic) සන්නිවේදනය යි.

- විවිධ අරමුණු පෙරදැරි ව දෛනික සන්නිවේදනයේ දී සෑම පුද්ගලයෙකුට ම බොහෝ අවස්ථාවල දී අන්තර්පුද්ගල සන්නිවේදනයේ යෙදීමට සිදු වේ. මෙය කිහිප ආකාරයකට සිදු වේ.

  1. මුහුණට මුහුණලා කෙරෙන පුද්ගලාන්තර සන්නිවේදනය

  2. යන්ත්‍ර සහායක පුද්ගලාන්තර සන්නිවේදනය

- මෙම සන්නිවේදනයේ දී සන්නිවේදකයා තරමට ම ග්‍රාහකයා ද වැදගත් වන්නේ ය.

- අන්තර්පුද්ගල සන්නිවේදනය මූලික ව සමාජ සම්බන්ධතා ගොඩනැගේ.

- අන්තර්පුද්ගල සන්නිවේදනය මුහුණට මුහුණලා ආසන්න ව සිදු වීමේ දී වාචික හා අවාචික සන්නිවේදන විධි ක්‍රම භාවිත කළ හැකි වේ. මෙහි දී බාධක අවම කරගත හැකි ය.

- අන්‍යොන්‍ය අවබෝධයෙන් මෙන් ම ආචාරශීලී ව සන්නිවේදනයේ යෙදීමෙන් දෙපාර්ශ්වයට ම ඵලදායි ප්‍රතිඵල ලබා ගත හැකි ය.

- අන්තර්පුද්ගල සන්නිවේදනයේ ප්‍රයෝජන කිහිපයක් පහතින් දැක්වේ.

  1. වඩාත් පහසුවෙන් අන්තර් ක්‍රියාකාරි (Interactive) සන්නිවේදනයක යෙදීමට ඇති හැකියාව

  2. අනෙකුත් සන්නිවේදන වර්ගයන්ට සාපේක්ෂ ව පෙළඹවීමේ හැකියාව වැඩි වීම

  3. අන්තර් සම්බන්ධතා වර්ධනය කර ගැනීමට හැකි වීම

  4. පහසුවෙන් අන්‍යොන්‍ය අවබෝධය හා විශ්වාසය තහවුරු කර ගත හැකි වීම

  5. වඩා තීව්‍ර සහවේදනයකට (empathy) අවකාශ සැලසීම

3. සමූහ සන්නිවේදනය (Group Communication)

- කිසියම් පිරිසක් හෙවත් සමූහයක් පොදු අරමුණක් ඇති ව එකට එක් ව සිදු කරන සන්නිවේදනය සමූහ සන්නිවේදනය යි.
- මෙහි දී සමූහ යන්නෙන් අදහස් වන්නේ කුඩා පිරිසකි. එනම් සීමා සහිත ප්‍රමාණයකින් යුතු සමූහයකි. සමූහයේ එකිනෙකා සමඟ පහසුවෙන් සන්නිවේදනයේ යෙදීමේ හැකියාව පවතී.
- මේ නිසා පුද්ගලාන්තර සන්නිවේදනයේ තරම් සමීප බවක් ද ජන සන්නිවේදනය තරම් දූරස්ථ බවක් ද සමූහ සන්නිවේදනයේ නැත.
- සමූහයට එක් වන පිරිස එකිනෙකා හඳුනන්නන් හෝ නොහඳුනන්නන් විය හැකි ය.
- අදාළ අවස්ථාව විධිමත් ව සැලසුම් කර ගැනීමෙන් සමූහ සන්නිවේදනය සාර්ථක කර ගත හැකි ය. එහි දී සන්නිවේදකයාට ඉවහල් කර ගත හැකි විධි ක්‍රම කිහිපයක් පහත දැක්වේ.
    - පෙර සූදානම
    - අරමුණු සහගත බව
    - අවාචික සන්නිවේදන විධික්‍රම භාවිතය
    - විවිධ තාක්ෂණික උපකරණ මෙවලම් භාවිතය
    - ප්‍රදීපාගාර උපක්‍රමය
    - ආකර්ෂණීය කථන විලාසය
    - ග්‍රාහක කේන්ද්‍රීය සන්නිවේදනය
    - ග්‍රාහක ප්‍රතිචාර පිළිබඳ ව සැලකිලිමත් වීම
    - කාල කළමනාකරණය
    - ආචාරශීලීභාවය
    - වගකීම හා වගවීම ආදිය මේ අතර වේ.

- සමූහ සන්නිවේදනයේ ප්‍රයෝජන කිහිපයක් පහතින් දැක්වේ.

1. සමාජීය පොදු කාර්යයන්වල දී ඉවහල් වීම
2. විවිධ මති මතාන්තර, අදහස් හා යෝජනා දැන ගැනීමට හැකි වීම
3. පුද්ගල සන්නිවේදන කුසලතා වර්ධනය කර ගැනීමට අවස්ථාව සැලසීම
4. සහභාගි වන පිරිසගෙන් ප්‍රතිචාර සහ ප්‍රතිපෝෂණ ලබා ගැනීමට හැකි වීම
5. දැනුම, සම්පත් ආදිය බෙදා හදා ගැනීමේ හැකියාව

4. මහජන සන්නිවේදනය (Public Communication)

- ජන සමූහයක් වෙත සිදු කරන සන්නිවේදනය මහජන සන්නිවේදනය නම් වේ. ප්‍රසිද්ධ රැස්වීම්, දේශන, විවිධ සැමරුම් උත්සව ආදිය මීට අයත් ය.

- මහජන සන්නිවේදනයේ දී සන්නිවේදකයා සහ ග්‍රාහකයා දෘශ්‍යමාන වුවත් හඬ ශ්‍රවණය කිරීමට හැකි වුවත් සමීප සන්නිවේදන කාර්යයක් සිදු නො වේ.

- මහජන සන්නිවේදනය සඳහා බොහෝ අවස්ථාවල දී තාක්ෂණික මෙවලම් භාවිත කරනු ලබයි.
- මහජන සන්නිවේදනය සාර්ථක ව සිදු වීමට නම් සන්නිවේදකයා ඉදිරිපත් කරනු ලබන සන්දේශය ග්‍රහණය කර ගැනීමට හැකි සීමාවක ග්‍රාහකයා රැඳී සිටිය යුතුය.

- මහජන සන්නිවේදනයේ දී ලැබෙන ප්‍රතිපෝෂණය නිසි ආකාරයෙන් අර්ථ කථනය කර ගැනීම අපහසු විය හැකි අතර ප්‍රතිපෝෂණය ද සීමා සහිත වේ.

- මහජන සන්නිවේදනය ක්‍රියාත්මක වන්නේ බොහෝ දුරට නිවාස, කාර්යාල වැනි පෞද්ගලික ව කිහිප දෙනෙකු රැස් වන ස්ථානයක නො වේ. ශ්‍රවණාගාර, පොදු ජනතාවට ඒකරාශි විය හැකි පොදු ක්‍රීඩාංගණ සහ සම්මන්ත්‍රණ ශාලා ආදි ස්ථානවල යි.

- යම් කරුණක් පිරිසකට දැනුම් දීමට හෝ පොළඹවා ගැනීමට හෝ විනෝදාස්වාදය, සතුට, ප්‍රබෝධය ලබා දීම සඳහා මහජන සන්නිවේදනය යොදා ගත හැකි ය. උදා : මැතිවරණ රැලි, සංගීත සංදර්ශන ආදි

- රැස්ව සිටින පිරිසට අදාළ වන පරිදි අන්තර්ගතය සකස් කර ගත හැකි නම් වඩාත් යෝග්‍ය වේ. එය සීමා සහිත පිරිසකට පමණක් අදාළ වන විට අන් අයගේ අවධානය ගිලිහේ.

- ඇතැම් අවස්ථාවල දී විශාල පිරිසක් ඒකරාශී වීම නිසා ඇති වන ව්‍යාකූල භාවය හේතුවෙන් ද අවධානය යොමු කර ගැනීම අපහසු විය හැකි ය.

- මහජන සන්නිවේදනයේ දී ග්‍රාහක පිරිස විවිධ ජන කොට්ඨාසයන්ගෙන් සමන්විත විය හැකි ය.

- මහජන සන්නිවේදනයේ ප්‍රයෝජන කිහිපයක් පහතින් දැක්වේ.
  1. කිසියම් අරමුණක් සඳහා ජන සමූහයක් පොළඹවා ගැනීමට හැකි වීම
  2. ප්‍රස්තුත කරුණු පිළිබඳ වැඩිදුර දැනුවත් කිරීමක් සිදු කිරීම සඳහා යොදා ගත හැකි වීම
  3. ප්‍රතිරූප ගොඩ නංවා ගැනීමට උපකාර වීම
  4. කිසියම් මතයක් නිර්මාණය කිරීමට හේතු වීම
  5. විවිධ පාර්ශවවල අවධානය දිනා ගැනීමට හැකි වීම

5. ජන සන්නිවේදනය (Mass Communication)

- එකිනෙකා නොහඳුනන විශාල ජන පිරිසකට ජනමාධ්‍ය හරහා එකවර සන්දේශයක් ලබා දීමේ ක්‍රියාවලිය ජන සන්නිවේදනය යි. (Hiebert,Ungurait,Bohn, 1988)
- 'වෘත්තීය සන්නිවේදකයන් යාන්ත්‍රික මාධ්‍ය වහල් කොට ගෙන පුළුල් ලෙසත් ක්ෂණිකවත් අඛණ්ඩවත් විශාල වූත් විවිධ වූත් ග්‍රාහක ක්ෂේත්‍රයන් වෙත සන්දේශය පතුරවමින් යම් බලපෑමක් ඇති කිරීමේ ක්‍රියාවලිය යි. (Defleur and Dennis, 2002)
- ජන සන්නිවේදනය සඳහා භාවිත කරනු ලබන ජනමාධ්‍ය මූලික වශයෙන් මෙසේ බෙදා දැක්විය හැකි ය.

ජන මාධ්‍ය
- මුද්‍රිත මාධ්‍ය
  - පොත්
  - පුවත්පත්
  - සඟරා
- විද්‍යුත් මාධ්‍ය
  - ගුවන්විදුලිය
  - රූපවාහිනිය


- අතිවිශාල ජන පිරිසක් එකවර ඉලක්ක කර ගනිමින් තොරතුරු බෙදා දෙයි.
- සන්දේශය පොදු ය. අන්තර්ගතය සැමට විවෘත වේ.
- ග්‍රාහක පිරිස විෂම ජාතීය පිරිසක් වේ. එමෙන් ම ජන සන්නිවේදනයේ ග්‍රාහක පිරිස සමාජයක සාමූහික ව විශේෂිත වූ පිරිසකි.
- සමාන්‍යයයෙන් සංකීර්ණ විධිමත් ආයතනික රටාවක් දක්නට ලැබේ.
- ජන සන්නිවේදනය සංකීර්ණ ක්‍රියාවලියකි. විවිධ ජන සන්නිවේදන ආකෘති මඟින් මෙම ක්‍රියාවලිය සරල ව පැහැදිලි කර ගත හැකි වේ.
- ජන සන්නිවේදන ක්‍රියාවලිය පිළිබඳ ඉදිරිපත් වී ඇති විවිධ ආකෘති අතරින් රේ. එල්ඩන් හයිබර්ට් (Ray Eldon Hiebert), ඩොනල්ඩ් ආර්. අන්ගුරේට් (Donald R. Ungurait), තෝමස් ඩබ්ලිව්. බෝන් (Thomas W. Bohn) යන විද්වතුන් තිදෙනා ඉදිරිපත් කළ HUB ආකෘතිය පිළිබඳ මෙහි දී කරුණු ඉදිරිපත් කෙරේ.
- ජන සන්නිවේදන ක්‍රියාවලිය එක් තැනකින් ආරම්භ වී ගොස් ප්‍රතිපෝෂණය ලෙස ආපසු හැරී එන ආකාරය මෙමඟින් විග්‍රහ කෙරේ.

- ජන සන්නිවේදන ක්‍රියාවලියට සම්බන්ධ වන විවිධ ප්‍රධාන අංග පිළිබඳ මෙම ආකෘතිය මඟින් විග්‍රහ කර ඇත.

01' සන්නිවේදකයෝ (Communicators)
02. කේත (Codes)
03. දොරටුපාලකයෝ (Gatekeepers)
04. ජනමාධ්‍ය (Mass Media)
05. නියාමකයෝ (Regulators)
06. පෙරහනු (Filters)
07. ග්‍රාහක ක්ෂේත්‍ර (Audience)
08. බලපෑම් (Effects)

- ජන සන්නිවේදන ක්‍රියාවලියේ දී ජනමාධ්‍ය ආයතන හිමිකාරිත්වය, දේශපාලන බලය, සමාජ සම්බන්ධතා මඟින් විවිධ සීමා හා පාලනයන් ජනමාධ්‍ය තුළ සිදු වේ.

- ප්‍රතිපෝෂණය, මාධ්‍ය විස්තාරණය සහ ජන සන්නිවේදන ක්‍රියාවලියේ දී ඇති වන මාධ්‍ය විකෘතිය සහ සෝෂාව වැනි කරුණු පිළිබඳ ව ද මෙම ආකෘතියෙහි දක්වා ඇත.




මාධ්‍ය විකෘතිය සහ සෝෂාව

01. සන්නිවේදකයෝ (Communicators)

- මෙහි සන්නිවේදකයෝ යන්නෙන් අදහස් වන්නේ ජන සන්නිවේදන ක්‍රියාවක නිරත වන පුද්ගලයන් ය. මෙහි දී සමාජයේ විවිධ තරාතිරම්වල පුද්ගලයන් මෙන් ම ආයතන ද සන්නිවේදකයාගේ භූමිකාව ක්‍රියාත්මක කළ හැකි ය.

02. කේත (Codes)

- කේත යනුවෙන් මෙහි දී අදහස් කරනු ලබන්නේ සන්නිවේදනය සඳහා යොදා ගනු ලබන සංකේත පද්ධතියකි.

03. දොරටුපාලකයෝ (Gate Keepers)

- දොරටුපාලකයෝ යනු කුමක් සන්නිවේදනය කරන්නේ ද යන්නත් එය සන්නිවේදනය කරන්නේ කෙසේ ද යන්නත් පිළිබඳ තීරණ ගන්නා පුද්ගලයෝ ය. දොරටුපාල ක්‍රියාව නිසා මාධ්‍ය සන්දේශ වාරණයට ලක් වේ.

04. ජනමාධ්‍ය (Mass Media)

- ජනමාධ්‍යයන්ගෙන් තොර ව ජන සන්නිවේදනයක් සිදු නො වේ. ජනමාධ්‍ය යනු සන්දේශයක් යවනු ලබන හුදු යාන්ත්‍රික ක්‍රියාවලියක් නොවේ. ජනමාධ්‍ය යනු ජනතාව එයින් බලාපොරොත්තු වන කාර්යයන් ඉටු කිරීමෙහි ලා නිර්මාණය වූ සමාජ ආයතනයන් ය.

05. නියාමකයෝ (Regulators)

- ඍජු ව ම මාධ්‍ය ආයතන හා සම්බන්ධ නො වුණ ද මාධ්‍ය කටයුතු හා සම්බන්ධ වූ ඒවා පාලනය කරන ආයතන හා පුද්ගලයෝ සිටිති. ඔවුන් පනවන රෙගුලාසි නිසා සන්දේශවල කිසියම් පාලනයක් සිදු වේ. නිදසුනක් ලෙස රාජ්‍ය කොමිෂන් සභා, උසාවි, වෘත්තීය සංවිධාන, පාරිභෝගිකයන් සහ බලපෑම් කණ්ඩායම් යන ආදි අය විවිධාකාරයෙන් මෙම නියාමන කාර්යය හා සම්බන්ධ වේ.

- ලෝකයේ සමහර රටවල ජනමාධ්‍ය නාලිකාවන් මෙන් ම මාධ්‍ය ආයතන සඳහා බලපෑම් කරන දැන්වීම් ආයතන ද බහුජාතික සමාගම් ද නියාමකයන් ලෙස සැලකිය හැකි ය.

06. පෙරහනු (Filters)

- ජනමාධ්‍ය සන්දේශ අවබෝධ කර ගැනීමට, පිළිගැනීමට, ප්‍රතික්ෂේප කිරීමට හෝ මතක තබා ගැනීමට ග්‍රාහක ක්ෂේත්‍රයේ සාමාජිකයන් යොදා ගනු ලබන ඔවුන් සතු අත්දැකීම් පසුතලය පෙරහන් යනුවෙන් අදහස් වේ.

07. ග්‍රාහකයෝ (Receivers)

- ජන සන්නිවේදන ග්‍රාහකයන් පිරිස විෂම ජාතීය, සාපේක්ෂ ව විශාල වූ, එකිනෙකා නොහඳුනන, ශාරීරික ව හා භාවාත්මක ව ජන සන්නිවේදකයාගෙන් සහ ග්‍රාහක ක්ෂේත්‍රයේ සාමාජිකයන්ගෙන් වෙන් වූ පිරිසකගේ එකතුවකි.

- ජනමාධ්‍යවලට හසු වන ග්‍රාහක කණ්ඩායම ඉතා විශාල වූවකි. ජල තටාකයක දිය රැළි ආරම්භයේ දී සුළු ප්‍රමාණයකින් ආරම්භ වුව ද, අවසානයේ දී විශාල ප්‍රදේශයකට විසිර යන්නා සේ ජනමාධ්‍යවලට හසුවන ග්‍රාහක කණ්ඩායම ද පුළුල් වේ. නූතන සමාජය අධික ලෙස මාධ්‍ය ග්‍රහණයට හසු වූවකි. එබැවින් එකිනෙකින් ලැබෙන තොරතුරු ප්‍රමාණය ද විශාල ය.

08. බලපෑම් (Effects)

- මෙහි දී බලපෑම යන්න දෙයාකාර වේ. 1. සමාජය කෙරෙහි බලපෑම
  2. පුද්ගලයා කෙරෙහි බලපෑම

- බලපෑම ජන සන්නිවේදන ක්‍රියාවලියේ ඉතා වැදගත් අංගයක් වන අතර එය අතිශය සංකීර්ණ වූවකි.

09. ප්‍රතිපෝෂණය (Feedback)

- එසැනින් ලැබෙන්නා වූ ප්‍රතිචාරය, තරමක් පසු වී ලැබෙන ප්‍රතිචාර හෝ ග්‍රාහක කණ්ඩායම්වලින් ලැබෙන ප්‍රතිචාර හෝ සංඛ්‍යා වශයෙන් හෝ මූල්‍යමය වශයෙන් ප්‍රකාශයට පත්වීමයි.

10. මාධ්‍ය විකෘතිය සහ ඝෝෂාව (Media distrotion and noise)

- ජන සන්නිවේදන ක්‍රියාවලියේ දී මාධ්‍ය විකෘතිය හා බාධක තත්ත්වයන් ඇති වීමට වැඩි ඉඩකඩක් ඇත. බාධක තත්ත්වයන් ජනමාධ්‍යයන්ගේ විවිධත්වය අනුව විවිධාකාර විය හැකි ය.

11. මාධ්‍ය විස්තාරණය (Media Amplification)

- මාධ්‍ය විස්තාරණය යන්න වටහාගත යුත්තේ කිසියම් කරුණක් සම්බන්ධයෙන් වැඩි අවධාරිත බලයක් මාධ්‍යගත කිරීම වශයෙනි. එය පුද්ගලයෙකු කෙරෙහි හෝ පොදු ක්‍රියාදාමයක් හෝ දෘෂ්ටි කෝණයක් පිළිබඳ ව හෝ වැඩි අවධාරිත බලපෑමක් ඇති කරයි. එය මාධ්‍ය විස්තාරණය යි.

- ජන සන්නිවේදන ක්‍රියාවලිය සරල ව පැහැදිලි කර ගැනීම සඳහා විවිධ ආකෘති ඉදිරිපත් වී ඇත. එම ආකෘති අධ්‍යයනය කිරීමෙන් තවදුරටත් ජන සන්නිවේදන ක්‍රියාවලිය පැහැදිලි කර ගත හැකි ය.

- ජන සන්නිවේදනයේ ප්‍රයෝජන කිහිපයක් පහතින් දැක්වේ. මෙම කරුණු පුළුල් අර්ථයෙන් ගත යුතු ය.

1. ප්‍රජානනය (Cognition) / දැනුම ලබා ගැනීම
2. අපසරණය (Divertion)/ විකල්ප වෙත යොමු කිරීම
3. සමාජ උපයෝගීතාව (Social Utility)
4. ආපසු ගැනීම් කිරීම (Withdrawal) (Dominic, Joseph, R., 2010)

**6. අතථ්‍ය සන්නිවේදනය (Virtual Commiunication)**

- 20 වන සියවසෙන් පසු තාක්ෂණික දියුණුව හේතුවෙන් ජනමාධ්‍ය ආකෘති හා අන්තර්ගත වෙනස්කම් රැසකට බඳුන් විය.

- වර්තමාන ගෝලීය ප්‍රවණතා හා තාක්ෂණික වර්ධන ක්‍රියාවලියේ විකාශයේ එක් අවස්ථාවක් ලෙස අථත්‍ය සන්නිවේදනය හැඳින්විය හැකි ය.

- Virtual යන ඉංග්‍රීසි වචනයේ සිංහල අර්ථය මලලසේකර ශබ්ද කෝෂයට අනුව 'නාමික ව නොවූව ද ප්‍රායෝගික ව, අතාත්වික, මවන ලද (කයින් නැති) අථත්‍ය, අථත්‍යතාව' **යන අර්ථ සපයා ඇත.** (මලලසේකර ශබ්දකෝෂය, 6 වන සංස්කරණය, 2014)

- අථත්‍ය සන්නිවේදනය යනු '*නව තොරතුරු තාක්ෂණයන්ගේ මැදිහත් වීම හේතුවෙන් චේතාන්විත ව හෝ අචේතනික ව හෝ අන්තර්ගතයන්, අභිප්‍රායයන්, ක්‍රියාකාරීන් විද්‍යමාන වීමට, විපරීත වීමට, ආදේශනය වීමට හෝ නිර්මාණය වීමට අවකාශය සලසන තොරතුරු, සන්නිවේදනයන් සහ ක්‍රියාකාරකම් වේ.*' බව උමෙයා විශ්වවිද්‍යාලය විසින් නිර්වචනය කර ඇත.

- අථත්‍ය සන්නිවේදනයේ ප්‍රධාන සංරචකය වන්නේ අන්තර්ජාලයයි. විද්‍යුත් තැපෑල (email) , වීඩියෝ සම්මන්ත්‍රණ (Video conferences) , සමාජ ජාල වෙබ් අඩවි (Social networking) සහ මාර්ගගත කතාබහ (Online chatting) සඳහා මාධ්‍ය වන්නේ අන්තර්ජාලය යි. ජංගම දුරකථනය ඔස්සේ ලබා දෙන සන්දේශයන් ද අථත්‍ය සන්නිවේදනයට අයත් වේ.

- අථත්‍ය සන්නිවේදනය විශේෂතා රැසකින් සමන්විත ය. එම විශේෂතා අතරින් කිහිපයක් මෙසේ දැක්විය හැකි ය.
    - කාර්යක්ෂම ව සන්නිවේදනයේ යෙදීමේ හැකියාව
    - අඩු පිරිවැය
    - ආරක්ෂිත බව
    - ශ්‍රව්‍ය දෘශ්‍ය අංග සහිත ව සන්නිවේදනයේ යෙදීමේ හැකියාව
    - එක වර පුද්ගලයන් රැසක් සමඟ සන්නිවෙදනයේ යෙදීමේ හැකියාව
    - භෞතික වශයෙන් ඉඩකඩ අවශ්‍ය නොවීම

- අතථ්‍ය සන්නිවේදනයේ ප්‍රයෝජන කිහිපයක් පහතින් දැක්වේ.

1. අධ්‍යාපන කාර්යය සඳහා
2. සම්බන්ධතා ගොඩනගා ගැනීමට
3. ව්‍යාපාරික කටයුතු සාර්ථක ව කාර්යක්ෂම ව සිදු කර ගැනීමට
4. ප්‍රචාරණ කටයුතු සඳහා
5. නිර්මාණාත්මක කාර්යය සඳහා චින්තනය පුබුදුවාලීමට

ඇගයීම

1. අභිමත භාවනාව, යාඥාව වැනි චිත්ත ඒකාග්‍රතා අභ්‍යාසයක නිරත වී තමාගේ සිත හැසිරෙන ආකාරය විශ්ලේෂණය කරන්න. (සද්ධර්ම රත්නාවලියේ භාගනෙය කථා වස්තුව ඇසුරින් මනස විස්තර කරන්න.)
2. එක් දිනක් තුළ ඔබ මුහුණ දුන් අන්තර්පුද්ගල සන්නිවේදන අවස්ථා විග්‍රහ කරන්න.
3. පාසලේ කලා උලෙළක්, මාධ්‍ය දින සංස්කෘතික වැඩසටහනක් සංවිධාන කිරීමේ දී පැවති සමූහ සන්නිවේදන කාර්යයක සන්නිවේදන අවස්ථා විග්‍රහ කරන්න.
4. දේශපාලන, ආගමික, සාහිත්‍ය, විනෝද, කලා, පොදු සේවා අරමුණ ඉටු කර ගැනීම සඳහා සංවිධාන කරන ලද මහජන සන්නිවේදන අවස්ථාවකට සහභාගි වී එහි ග්‍රාහකයා ආකර්ෂණය කර ගැනීමට යොදාගත් සන්නිවේදන උපක්‍රම විග්‍රහ කරන්න.
5. ජන සන්නිවේදන මාධ්‍ය සතු ලක්ෂණ ඇසුරින් තෝරාගත් ලක්ෂණ අභිමත විද්‍යුත් හෝ මුද්‍රිත මාධ්‍ය භාවිත ඇසුරින් විමර්ශනය කරන්න.
6. පෞද්ගලික ව ඔබ අත්විඳි අතථ්‍ය සන්නිවේදන අවස්ථාවක ලක්ෂණ විග්‍රහ කරන්න.

**නිපුණතා මට්ටම** : 3.2 සන්නිවේදන ස්වරූප පිළිබඳ පැහැදිලි කරමින් භාවිතයේ දී යොදා ගනියි.

**කාලච්ඡේද** : 10 යි.

**ඉගෙනුම් පල** :
- විවිධ සන්නිවේදන ස්වරූප හඳුන්වා දෙයි.
- සන්නිවේදන ස්වරූප භාවිත වන ආකාරය නිදසුන් දක්වමින් පැහැදිලි කරයි.
- විවිධ සන්නිවේදන ස්වරූප පිළිබඳ අවබෝධයෙන් ඉදිරිපත් කිරීම් කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න.

- සන්නිවේදන ස්වරූප යන්න ඉංග්‍රීසි භාෂාවෙන් Forms of Communication ලෙස අර්ථ දක්වේ. මෙහි දී පළමු ව ස්වරූප යන්නෙහි වාච්‍යාර්ථය පිළිබඳ ව විමසා බැලීම වැදගත් වේ.
- මහා සිංහල ශබ්දකෝෂයට අනුව **ස්වරූප** - (1) තමාගේ ම රූපය, ආකාරය, හැඩය, පෙනුම, (2) ස්වභාවය, තත්ත්වය, ගතිය, තොරතුරු, ඇති සැටිය, ආරංචිය, ප්‍රවෘත්තිය, පණිවුඩය, විස්තරය 1962 පි.
- සන්නිවේදනයේ විවිධ ස්වරූප ගණනාවක් ඇත. ඒ අතර වාචික, නිර්වාචික, කථන, ශ්‍රව්‍ය, දෘශ්‍ය ලිඛිත, රූපණය සහ විධිමත් අවිධිමත් ආදි ස්වරූප වේ.
- මෙම සන්නිවේදන ස්වරූප, කුසලතා ලෙස වර්ධනය කර ගත හැකි ය. එමඟින් සාර්ථක සන්නිවේදනයකට මඟ පෙන්වයි.

1. වාචික සන්නිවේදනය (Verbal Communication)

- කිසියම් භාෂාවක පවතින ශබ්ද රටා සහ වචන රටා භාවිත කරමින් සිදු කරන සන්නිවේදනය වාචික සන්නිවේදනය යි.
- වාචික සන්නිවේදනයේ කාර්යය
    - ඉගැන්වීම, උපදෙස් දීම හා මඟ පෙන්වීම
    - පුද්ගලයන් අතර තොරතුරු හුවමාරුව
    - මානව සබඳතා පවත්වා ගැනීම
    - සිතෙහි ඇතිවන භාවයන් ප්‍රකාශයට පත් කිරීම
    - පුද්ගල පෞරුෂය ඇති කිරීම හා විවිධ කාර්යයන් ඉටු කර ගැනීම

**වාචික සන්නිවේදන කුසලතා**

- යමක් ප්‍රබල ලෙස ඉදිරිපත් කිරීමට සන්නිවේදකයෙක් සතු විය යුතු වාචික සන්නිවේදන කුසලතා වැදගත් වේ. ඒ සඳහා
    - වාග් කෝෂය පුළුල් කර ගැනීම
    - තමා සතු අදහස් හා තොරතුරු ඇතුළත් දැනුම වර්ධනය කර ගැනීම
    - පෙර සූදානම
    - ඉදිරිපත් කිරීමේ කුසලතා වැඩි දියුණු කර ගැනීම
    - යෝග්‍ය භාෂාවක් භාවිතය
    - පෞද්ගලික අනන්‍යතාවක් හා ස්වීයත්වයක් ගොඩ නඟා ගැනීම
    - වගකීමෙන් යුතු ව වචන භාවිතය

**2. නිර්වාචික සන්නිවේදනය** (Non verbal Communication)

- ලිඛිත හෝ කථන වචන භාවිතයෙන් තොරව එක් පුද්ගලයෙක් විසින් තවත් පුද්ගලයෙක් වෙත තොරතුරු ඉදිරිපත් කිරීම නිර්වාචික සන්නිවේදනය යි.

- නිර්වාචික සන්නිවේදනය ප්‍රධාන වශයෙන් සංඥා භාෂාව (Sign Language) හා හෙවත් සිරුරු බස (Body Language) ලෙස ප්‍රධාන කොටස් දෙකකට බෙදා දක්වයි.

- සංඥා භාෂාව සඳහා ශ්‍රව්‍ය සංඥා හා දෘශ්‍ය සංඥා ඇතුළත් වේ.

- සංඥා භාෂාව (Sign language) යන්නට සියලු ආකාරයේ සංකේත, සංඛ්‍යා, පින්තූර, රූපසටහන්, පෝස්ටර් ඡායාරූප, ශබ්ද සංඥා, පෝස්ටර් චිත්‍ර, කාටූන්, සිතියම් ඇතුළත් වේ.

- පහසුවෙන් ග්‍රහණය කර ගත හැකි සහ මතක තබා ගත හැකි, ලෝකය පුරා පොදුවේ භාවිත වන දෘශ්‍ය සංඥා හා ශ්‍රව්‍ය සංඥා රැසක් ඇත. දුම් බීම තහනම් ලකුණ, ගැහැණු සහ පිරිමි රූප, මාර්ග සංඥා, ආලෝක සංඥා, බෙර හඬ, සයිරන් නලා හඬ, චිත්‍ර, කාටූන් සිතියම් ආදිය ඇතුළත් වේ.

- සිරුරු බස යන්නට මුහුණෙන් ඉදිරිපත් වන ප්‍රකාශනයන්, ඉරියව්, ඉඟි, මුද්‍රා, නර්තන විලාස අභිනයන් ආදිය අන්තර්ගත වේ.

- සිරුරු බසින් සන්නිවේදනය වන අර්ථ රටකින් රටකට, ජන වර්ගයකින් ජන වර්ගයකට වෙනස් විය හැකි ය. උදාහරණයක් ලෙස දෙදෙනෙකු හමු වී සුබ ප්‍රාර්ථනා කරන අයුරු විමසන්න.

- සාර්ථක සන්නිවේදනයක යෙදීමට සංඥා භාෂාව සහ සිරුරු බස ඇතුළත් නිර්වාචික සන්නිවේදනය ඵලදායි ලෙස භාවිත කළ හැකි ය.

3. කථන සන්නිවේදනය (Oral Communication)

- මුවින් පිටවන වචන හා ශබ්ද අනුසාරයෙන් විවිධ අර්ථ ජනනය කිරීම කථන සන්නිවේදනය යි. භාෂාවක් භාවිතයෙන් අන්‍යෝන්‍ය වශයෙන් අදහස් හුවමාරු කර ගැනීමක් සිදු වන බැවින් දෛනික සන්නිවේදනයේ බොහෝ අවස්ථාවල දී කථන ස්වරූපය භාවිත වේ.

- වාචික සන්නිවේදනයෙන් කථන සන්නිවේදනය වෙනස් වේ. වාචික සන්නිවේදනයේ දී වචන ශබ්ද නඟමින් හෝ ලිඛිත ව භාවිත කළත් කථන සන්නිවේදනයේ දී එය මුවින් පිට වන වදන්වලට පමණක් සීමා වේ. කථන සන්නිවේදනය ආචාරශීලී ව, ආකර්ෂණීය ව, අර්ථපූර්ණ ව භාවිත කළ යුතු ය.

- කථනය පුද්ගලයෙකු සතු වර්ධනය කළ හැකි කුසලතාවකි. මනා සවන් දෙන්නෙකු වීම කථන සන්නිවේදන කුසලතා වර්ධනය කර ගැනීමට හේතු වේ.

- කථන සන්නිවේදනය,

  * එය නිරායාසයෙන් සිදු වේ.
  * ස්වාභාවික ය.
  * අන් අයට පහසුවෙන් අවබෝධ කරගත හැකි ය.
  * ග්‍රාහකයා අනුව වචන තෝරා ගත හැකි ය.
  * නිර්වාචික සන්නිවේදනයේ උදව් ලබා ගත හැකි ය.
  * සන්නිවේදකයා, ඉදිරිපත් කරන්නා සැම විට ම ශාරීරික ව පෙනී සිටියි.

- ග්‍රාහක මණ්ඩලයට අනුව කථන සන්නිවේදනය වෙනස් වේ. උදාහරණ ලෙස පූජ්‍ය පක්ෂය සමග කථනයේ යෙදීම, දරුවෙකු සමග කථනයේ යෙදීම

- කථන සන්නිවේදනය කුසලතා සාක්ෂරතාව සඳහා, චින්තනය වර්ධනය කර ගැනීම සඳහා හා ඉගෙනීම වැනි කරුණු සඳහා අත්‍යවශ්‍ය වේ.

- කථන සන්නිවේදනය කුසලතා වර්ධනයට හේතු වන කරුණු කිහිපයක් පහත සඳහන් වේ.

  - සවන් දීම
  - කියවීම
  - දක්ෂ කථිකයන්ගේ කතා අනුකරණය කිරීම
  - කථන පුහුණුව
  - තනි පුද්ගලයෙකුට ඇමතීම
  - සමූහයක් ඇමතීම
  - හඬ නඟා උච්චාරණය කිරීම
  - විවිධ දේ කථනයෙන් ඉදිරිපත් කිරීම (උදාහරණ ලෙස නාට්‍ය දෙබස්, වාර්තා කථන ආදි)

**4. රූපණය (Performing)**

- ක්‍රියාකාරකමක් වශයෙන් හෝ වෘත්තියක් වශයෙන් යම් රංගනයක යෙදීම මෙයින් අදහස් වේ.
- රූපණ යන්නෙහි වාච්‍යාර්ථය - දැක්වීම, විස්තර කිරීම, චරිතාදිය නිරූපණය කිරීම, මවා පෙන්වීම ලෙස මහා සිංහල ශබ්දකෝෂයෙහි සඳහන් කරයි. (විජේතුංග හරිස්චන්ද්‍ර, 2017)
- රංගනයේ යෙදීමෙන් යම් යම් අර්ථ සන්නිවේදනය කළ හැකි ය.
- ප්‍රාථමික මානවයාගේ සිට වර්තමානය දක්වා ම රංගනය මගින් සන්නිවේදන කාර්යයන් සිදු ව ඇත.
- අදාළ පරිදි යොදා ගැනීමෙන් සන්නිවේදනය වඩාත් ඵලදායී කර ගැනීම සඳහා රූපණය ඉතා වැදගත් වේ.
- ආචාරශීලී ව කතා බහේ යෙදීමේ සිට පුද්ගල ජීවිතයේ සියලු සන්නිවේදන කාර්යයන් සඳහා රූපණය උපකාර වේ.
- උපකරණ භාවිතය, හැඩ ගැන්වීම්, ඇඳුම් පැළඳුම් වැනි දේ භාවිතයෙන් රූපණය ප්‍රබල කර ගත හැකි ය.
- රූපණ කුසලතා වර්ධනයට හේතු වන කරුණු කිහිපයක් පහත සඳහන් වේ.
  - රූපණ අවස්ථා නිරීක්ෂණය
  - අනුකරණය
  - විවිධ අවස්ථා අනුව රූපණය වෙනස් වන ආකාරය අවබෝධ කර ගැනීම

    උදා :- කථිකයකුගේ කතාවක්, ගුරු භූමිකාව, නිවේදක භූමිකාව, රංගන ශිල්පියෙකුගේ භූමිකාව, විවාද කණ්ඩායමක සමාජිකයන්ගේ ස්වභාවය

  - විවිධ සන්නිවේදන අවස්ථා රූපණයෙන් ඉදිරිපත් කිරීම

**5. ලිඛිත සන්නිවේදනය (Written Communication)**

- භාෂාව හා සංකේත මගින් තොරතුරු ඉදිරිපත් කිරීම ලිඛිත සන්නිවේදනය යි.
- ලිඛිත සන්නිවේදනය යන්නට ලිපි, දැන්වීම්, චක්‍රලේඛ, වාර්තා, පුවත්පත්, සඟරා ආදිය උදාහරණ වශයෙන් දැක්විය හැකි ය.
- ලිඛිත සන්නිවේදනය නිර්මාණාත්මක ක්‍රියාකාරකමකි.

- ලිඛිත සන්නිවේදනය සඳහා සාක්ෂරතාව අත්‍යවශ්‍ය වේ.
- ලිඛිත සන්නිවේදනයෙන් කියවීමට හැකි ජනතාව සඳහා තොරතුරු ඉදිරිපත් කිරීම සිදු කරයි.
- කථන සන්නිවේදනයට සාපේක්ෂ ව වඩාත් සංවිධානාත්මක ව ගොඩනැගිය හැකි ය.
- අනාගත භාවිතය සඳහා තොරතුරු ගබඩා කර තැබිය හැකියාව ඇත.
- අධ්‍යාපනය, නිර්මාණාත්මක ලේඛන කාර්යය, ආයතනික කටයුතු සහ නීතිමය කාර්යය ආදි කාර්යය සඳහා ලිඛිත සන්නිවේදනය ඉතා අවශ්‍ය වේ.
- නිවැරදි ලෙස ලේඛනය සිදු නොවුණහොත් වැරදි අවබෝධ ඇති වීමේ අවධානම පවතී.
- ලිඛිත සන්නිවේදනය කුසලතා වර්ධනයට හේතු වන කරුණු කිහිපයක් පහත සඳහන් වේ.
    - ලිවීමේ කුසලතා හඳුනා ගැනීම
    - සාක්‍ෂරතා හැකියාව
    - පොත පත කියවීම
    - නිරවුල් ව පැහැදිලි ව සංවිධානාත්මක ව ලිපි ලේඛන ලිවීම
    - නිර්මාණශීලී භාවය වර්ධනය කර ගැනීම

**6. ශ්‍රව්‍ය සන්නිවේදනය** (Audio Communication)

- සවන් දීම පදනම් කර ගත් ශබ්ද මාධ්‍යයයේ ඕනෑම වර්ගයක සම්ප්‍රේෂණ ස්වරූපයක් ශ්‍රව්‍ය සන්නිවේදනය ලෙස හැඳින්විය හැකි ය.
- ශබ්දය හෙවත් හඬ යන්න ජීවී හෝ අජීවී වස්තූන්ගෙන් හෝ මාධ්‍යයන් මඟින් ඉදිරිපත් වේ.
- මෙහි දී සිදු වන්නේ යමක් ශ්‍රවණය කිරීමෙන් යම් අදහසක් තේරුම් ගැනීම යි. ස්වාභාවික ශබ්ද, කෘත්‍රිම ශබ්ද, සංගීතය, නිහඬ බව, සාකච්ඡා, කවි ගායනා, දේශන, කථා ආදිය මෙයට අයත් ය.
- ශ්‍රව්‍ය සන්නිවේදනය අද්‍යතනයේ තාක්‍ෂණය හා බද්ධ ව ඇති නිසා විවිධ ස්වරූපයේ හඬ මෙවලම් භාවිතයට පැමිණ ඇති අතර හඬ සංරක්ෂණය කර ගැනීමේ ක්‍රම ද දියුණු තත්තත්වයට පත් ව ඇත. සංයුක්ත තැටි, ශ්‍රවණය කළ හැකි පොත්, සංගීත තැටි ආදිය එවැනි මෙවලම් කිහිපයකි.
- පුද්ගලයෙකුගේ හඬ මඟින් ඔහුගේ ශක්‍යතාව, පෞරුෂය, දක්ම, චින්තනය, ස්වර විශේෂතා ආදිය පමණක් නො ව අධ්‍යාත්මික ගති ලක්ෂණ (විවෘත බව, අවංක බව වැනි ගුණාංග) පවා අවබෝධ කර ගත හැකි ය.
- ශ්‍රව්‍ය සන්නිවේදනය අතීතයේ ආදි මානවයාගේ සිට ප්‍රබල සන්නිවේදන ස්වරූපයක් ලෙස භාවිත කර ඇත.

- ශ්‍රව්‍ය සන්නිවේදනය කුසලතා වර්ධනයට හේතු වන කරුණු කිහිපයක් පහත සඳහන් වේ.
    - මැනවින් සවන් දීම
    - විවිධ හඬවල් වෙන් කර හඳුනා ගැනීම
    - ශ්‍රව්‍ය සන්නිවේදනය අවස්ථා අධ්‍යයනය කිරීම
    - විවිධ ශබ්ද භාවිත කරමින් නිර්මාණ කිරීම

**7. දෘශ්‍ය සන්නිවේදනය** (Visual Communication)

- ඇස උපයෝගී කොට ගෙන දැකීමෙන් හා බැලීමෙන් අදහස් හා තොරතුරු එක් රැස් කර ගන්නේ නම් එම සන්නිවේදනය දෘශ්‍ය සන්නිවේදනය යි.
- ප්‍රාථමික මානවයාගේ පටන් අද්‍යතනය දක්වා සන්නිවේදන කාර්යය සඳහා දෘශ්‍ය සන්නිවේදනය භාවිත කර ඇත.
- දෘශ්‍ය සන්නිවේදනය යන්නට සංඥා, මුද්‍රණාක්ෂර, ග්‍රාෆික නිර්මාණ, චිත්‍ර සටහන්, වර්ණ, සජීවීකරණය, චිත්‍රපට ආදි වූ අංග රැසක් අයත් වේ.
- සංකේත හා දෘශ්‍ය සන්නිවේදනය පිළිබඳ අධ්‍යයනය කිරීම සංඥාර්ථවේදය (Semiotics) ලෙස හඳුන්වයි.
- වර්තමානයේ සන්නිවේදන තාක්ෂණයේ දියුණුවත් සමඟ දෘශ්‍ය සන්නිවේදනය ප්‍රබල වී ඇත.
- අන්තර්ජාලය, සමාජ මාධ්‍ය, රූපවාහිනී මාධ්‍ය ආදියෙහි ඉතා නිර්මාණශීලී ව හා ආකර්ෂණීය ලෙස දෘශ්‍ය සන්නිවේදනය භාවිත වේ.
- දෘශ්‍ය සන්නිවේදනය කුසලතා වර්ධනයට හේතු වන කරුණු කිහිපයක් පහත සඳහන් වේ.
    - රූප මැනවින් දැකීම
    - රූප හඳුනා ගැනීම
    - අධ්‍යාපනික කාර්යය සඳහා රූප භාවිතයට ගැනීම
    - දෘශ්‍ය සන්නිවේදන අංග යොදා ගනිමින් නිර්මාණ කිරීම

**8. විධිමත් සන්නිවේදනය** (Formal Communication)

- සන්නිවේදකයා පැහැදිලි ව හඳුනාගත හැකි සන්නිවේදන අවස්ථාවකි.
- සෑම විට ම නිල වශයෙන් ඉදිරිපත් වන කිසියම් වගකීමක් සහිත ලේඛනයක් හෝ ප්‍රකාශයකි.
- නිල වාර්තා, සිහි කැඳවීම් (memo), ලිපි ශීර්ෂය (Letter Head) සහිත ලිපි, ගැසට් නිවේදන, නිල විද්‍යුත් තැපැල් ආදි ලිඛිත ප්‍රකාශන විධිමත් සන්නිවේදනයට උදාහරණ කිහිපයකි.

- ලිඛිත ප්‍රකාශන මෙන් ම නිල වශයෙන් සිදු කරනු ලබන ප්‍රකාශනයන් විධිමත් සන්නිවේදනය යටතට ගැනේ. උදා: වාර්ෂික අයවැය ප්‍රකාශන, රාජ්‍ය නායකයන් සිදු කරනු ලබන නිල ප්‍රකාශ, රාජ්‍ය ආයතනවල නිල මාධ්‍ය ප්‍රකාශකගේ ප්‍රකාශන, කැබිනට් ප්‍රකාශක නිශ්චිත ධූරාවලියක් සහිත ක්‍රියාවලියකි.

- විධිමත් සන්නිවේදනය නිශ්චිත ධූරාවලියක් සහිත ක්‍රියාවලියකි.

- විධිමත් සන්නිවේදනය වඩාත් ප්‍රතිඵලදායී සන්නිවේදන ස්වරූපයකි.

- විධිමත් සන්නිවේදනය කිසියම් ආකාරයක ක්‍රියාපටිපාටියකට අනුගත ව පියවර ගණනාවකින් යුක්ත ව ක්‍රියාත්මක වේ.

- විධිමත් සන්නිවේදනයේ දී භාවිත වන නිල ලේඛන හා ප්‍රකාශන අවශ්‍ය අවස්ථාවන්හි දී උපුටා දැක්වීම සඳහා යොදාගත හැකි ය.

9. **අවිධිමත් සන්නිවේදනය** (Informal Communication)

- මූලාශ්‍රය පැහැදිලි ව හඳුනාගත නොහැකි සන්නිවේදන අවස්ථාවකි.
- කිසිදු නිල ස්වභාවයක් නොමැත. (උදා: කට කතා, ඔප දූප, කැලෑ පත්තර ආදී)
- නිල ප්‍රකාශයක් හෝ විධිමත් සන්නිවේදනයක් නොමැති අවස්ථාවල දී අවිධිමත් සන්නිවේදනය ක්‍රියාත්මක වේ.
- අවිධිමත් සන්නිවේදන ප්‍රකාශන වේගයෙන් පැතිරේ.
- අවිධිමත් සන්නිවේදනය ජනතාවගේ හැඟීම්, ආකල්ප, විරෝධතා ආදිය ප්‍රකාශ කිරීමට ඉඩකඩ සලසා දෙයි.
- නූතන සන්නිවේදන තාක්ෂණ ක්‍රම භාවිතයෙන් අවිධිමත් සන්නිවේදනය වඩාත් ප්‍රබල ව හා ආකර්ෂණීය ව සිදු කරනු ලබයි.

**ඇගයීම**

1. විවිධ සන්නිවේදන ස්වරූප නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.

2. ඔබ කැමති සන්නිවේදන ස්වරූප එකක් හෝ කිහිපයක් භාවිත කරමින් සන්දේශයක් ඉදිරිපත් කරන්න.

**නිපුණතා මට්ටම** : 3.3 සන්නිවේදන ආකෘති පිළිබඳ න්‍යායාත්මක කරුණු අවබෝධයෙන් යුතු ව විග්‍රහ කරයි.

**කාලච්ඡේද** : 25 යි

**ඉගෙනුම් පල** :
- සන්නිවේදන ආකෘති හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- සන්නිවේදන ක්‍රියාවලිය සිදු වන ආකාරය පිළිබඳ ආකෘති ඇසුරින් පැහැදිලි කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්:**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න.

- සන්නිවේදනය විවිධ අංග ලක්ෂණවලින් සමන්විත සංකීර්ණ ක්‍රියාවලියකි. සන්නිවේදනයේ මෙම ස්වභාවය අවබෝධ කර ගැනීම සඳහා සන්නිවේදන ආකෘති උපකාර වේ.
- සමාජ ක්‍රියාවලියක් හෝ සන්නිවේදන ක්‍රියාවලියක ස්වභාවය පැහැදිලි කරනු ලබන විස්තරයක් ආකෘති මගින් ඉදිරිපත් කෙරේ. බොහෝ අවස්ථාවල දී මේ සඳහා රූප සටහන් ද භාවිත කරනු ලබයි.
- එමෙන් ම සන්නිවේදන ආකෘති මගින්,
  - සන්නිවේදන ක්‍රියාවලියේ විද්‍යමාන වන දේ සාරාංශ කර දැක්වීම
  - තොරතුරු ගලා යාම පෙන්වීම
  - සන්නිවේදකයාගේ හා ග්‍රාහකයාගේ ස්වරූපය, දක්ෂතා හා ප්‍රබලත්වය පෙන්වීම
  - මාධ්‍ය ක්‍රියාවලිය සිදු වන ආකාරය
  - සන්නිවේදනයේ ස්වභාවය අවශ්‍යතාව, අවස්ථාව ආදිය හඳුනා ගැනීම යන කරුණු කිහිපයක් සිදු වේ.
- 'සන්නිවේදනය හා සම්බන්ධ මූලික අංග ලක්ෂණ කිහිපයක් සන්නිවේදන ආකෘතියක් මගින් ඉදිරිපත් කරනු ලැබේ. සන්නිවේදනයෙහි සැබෑ ස්වරූපය වටහා ගැනිමට උපකාරී වන මුඛ්‍ය ලක්ෂණ කිහිපයක් තෝරා, ඒවා අතර පවත්නා අන්‍යෝන්‍ය සම්බන්ධය මතු කොට දැක්වීම සන්නිවේදන ආකෘතියකින් ඉටු වන ප්‍රධාන කර්තව්‍යවකි.' යනුවෙන් මහාචාර්ය විමල් දිසානායක මහතා මානව සන්නිවේදනය කෘතියේ සන්නිවේදන ආකෘති යන්න විග්‍රහ කර ඇත.
- සංකීර්ණ සන්නිවේදන ක්‍රියාවලිය සරල ව පැහැදිලි කිරීම සඳහා විවිධ විෂය ක්ෂේත්‍රවල විද්වතුන් විසින් විවිධ දෘෂ්ටි කෝණයන්ගෙන් සන්නිවේදන ක්‍රියාවලිය විග්‍රහ කරමින් ආකෘති ගණනාවක් ඉදිරිපත් කර ඇත.
- සන්නිවේදකයා, ග්‍රාහකයා, බලපෑම, සන්නිවේදනයේ තාක්ෂණික ක්‍රියාවලිය ආදිය කේන්ද්‍ර කර ගනිමින් විවිධ ආකෘති වර්ග ඉදිරිපත් කර ඇත.
- මෙහි දී සන්නිවේදනය පිළිබඳ රේඛීය හා රේඛීය නොවන ආකෘති පමණක් සාකච්ඡා කෙරේ.
  1. රේඛීය ආකෘති (Linear Models)
     එක් පාර්ශ්වයක සිට අනෙක් පාර්ශ්වයට පමණක් තොරතුරු ගලා යාම පෙන්වයි.

2. රේඛීය නොවන ආකෘති (Non Linear Models)

මෙහි දී සන්නිවේදන ක්‍රියාවලිය ද්විපාර්ශ්වික ව, චක්‍රාකාර මෙන් ම විවිධාකාර ස්වරූපයන්ට විහිදී ගලා යයි. ග්‍රාහක ප්‍රතිචාර, සන්නිවේදකයා මෙන් ම ග්‍රාහකයාගේ ක්‍රියාකාරිත්වය මත සන්දේශයේ ස්වභාවය වෙනස් විය හැකි ය.


- ප්‍රධාන සන්නිවේදන ආකෘති 4ක් පිළිබඳ මෙහි දී අවධානය යොමු කෙරේ.

  1. ඇරිස්ටෝටල් ආකෘතිය
  2. හැරල්ඩ් ඩී. ලැස්වෙල් ආකෘතිය
  3. ක්ලෝඩ් ශැනොන් හා වොරන් වීවර් ආකෘතිය
  4. ශ්‍රාම් - ඔස්ගුඩ් ආකෘතිය

1. **ඇරිස්ටෝටල් ආකෘතිය**

- ග්‍රීසියේ ප්‍රකට දර්ශනිකයෙකු වූ ඇරිස්ටෝටල් පඬිවරයා **(ක්‍රි.පූ. 384 322)** විසින් කථන සන්නිවේදන තත්ත්වයන් පිළිබඳ ව අවධානය යොමු කරමින් රචනා කරන ලද වාග් අලංකරණ ශාස්ත්‍රයට අදාළ රිටොරික් (Rhetoric) නම් ග්‍රන්ථයේ සන්නිවේදනය සම්බන්ධ කරුණු සඳහන් වේ.

- මෙම ආකෘතිය මඟින් ප්‍රධාන වශයෙන් සන්නිවේදන ක්‍රියාවලිය සඳහා අත්‍යවශ්‍ය මූලිකාංග පහක් පිළිබඳ ව පැහැදිලි කරයි.




කථිකයා : සන්දේශය ඉදිරිපත් කරන්නා මෙමඟින් අර්ථ දැක්වේ. කථකයා විසින් ඉලක්කගත කණ්ඩායමට හා අවස්ථාවට ගැළපෙන ලෙස සිය කථාව සැලසුම් කරගත යුතු ය. එමඟින් ශ්‍රාවක පිරිස තුළ යම් බලපෑමක් හෝ නැතහොත් පෙලඹවීමක් ඇති කිරීමට හැකි විය යුතුය.

කථාව : කථිකයා ඉදිරිපත් කරන තොරතුර යි. කථාව ශ්‍රාවකයා පොලඹවන සුළු එකක් විය යුතුය. දියුණු සන්නිවේදන තාක්ෂණයක් කිසිසේත් නො තිබූ එකල කණ්ඩායම් වශයෙන් සන්නිවේදනය කිරීමේ දී භාවිත වූ කථාව හෙවත් දේශනය මෙහි දී ඉවහල් කර ගෙන ඇත.

ශ්‍රාවකයා : කථාව හෝ දේශනය අසා සිටින්නන් පිළිබඳ ව මින් කියැවේ. මෙහි ශ්‍රවකයා අක්‍රීය සවන් දෙන්නෙක් පමණි.

අවස්ථාව : සන්දේශය ලබා දීමට හේතු වන තත්ත්වය මෙයින් අදහස් වේ.

බලපෑම : සන්නිවේදනය සිදු කරන්නේ නිශ්චිත අරමුණක් පෙරදැරි ව ය. ශ්‍රාවකයා යම් අදහසක් වෙත පොලඹවා ගැනීම සඳහා යි.

- මෙම ආකෘතියේ විශේෂතාඃ


 1. මූලික අංග පහක් පිළිබඳ ව අවධානය යොමු කිරීම
 2. ඒක මාර්ගික ආකෘතියක් වීම
 3. ප්‍රතිචාර ප්‍රතිපෝෂණයන් පිළිබඳ ව සඳහන් නොවීම
 4. සමකාලීන සන්නිවේදන කාර්යභාරය පිළිබඳ ව පමණක් අවධානය යොමු කොට කරුණු විග්‍රහ කිරීම
 5. නූතන සංකීර්ණ සන්නිවේදන ක්‍රියාවලිය විවරණය කිරීමට ප්‍රමාණවත් නොවීම

2. **හැරල්ඩ් ඩී. ලැස්වෙල් ආකෘතිය**

- අමෙරිකානු ජාතික දේශපාලන විද්‍යා මහාචාර්යවරයකු වූ හැරල්ඩ් ඩී. ලැස්වෙල් (1902 - 1978) විසින් 1948 දී ඉදිරිපත් කරන ලද අදහස් ඇසුරෙන් ගොඩනගන ලද ආකෘතියකි. පළමුවන ලෝක යුද්ධයේ දී භාවිත කළ ප්‍රචාරණ විධි ක්‍රම පිළිබඳ ලැස්වෙල් විසින් අධ්‍යයනය කර ඇත.

- ඔහු ඉදිරිපත් කර ඇති ආකෘතිය ප්‍රධාන වශයෙන් කොටස් 5කින් සමන්විත ය.

 1. කවුද ? (Who says ?) - සන්නිවේදකයා
 2. කුමක් කියයි ද? (What ?) - සන්දේශය
 3. කුමන නාලියකින් ද? (In which channel ?)
 4. කාට ද ? (To whom ?) - ග්‍රාහකයා
 5. කුමන බලපෑමක් සඳහා ද? (With what effect ?)




- මෙම ආකෘතියේ විශේෂතාː

    1. මෙය රේඛීය සන්නිවේදන ආකෘතියකි.


    2. ප්‍රතිපෝෂණය සහ බාධක මෙම ආකෘතියේ සඳහන් නොවේ.

    3. මෙමඟින් සන්නිවේදන ක්‍රියාවලියේ දී සිදුවන බලපෑම පිළිබඳ වැඩි අවධානයක් යොමු කර ඇත.

3. **ශැනොන් හා වීවර් ආකෘතිය**

- අමෙරිකානු ජාතික ගණිතඥයන් දෙදෙනෙකු වූ ක්ලෝඩ් ශැනොන් (1916 - 2001) සහ වොරන් වීවර් (1894 - 1978) යන දෙදෙනා විසින් 1949 දී සන්නිවේදනය පිළිබඳ මෙම ගණිතමය ආකෘතිය ඉදිරිපත් කර ඇත.

- සන්නිවේදනයේ තාක්ෂණික ක්‍රියාවලිය කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇති මෙහි මිනිසා හා යන්ත්‍ර සූත්‍ර මඟින් සන්නිවේදන ක්‍රියාවලිය වෙත සිදු කරනු ලබන බලපෑම ද විග්‍රහ කර ඇත.



- මෙම ආකෘතියෙහි ප්‍රධාන කරුණු කිහිපයක් ඇතුළත් වේ.

  1. තොරතුරු මූලාශ්‍රය (Infomation Sources)
  2. සන්දේශය (Message)
  3. සම්ප්‍රේෂණාගාරය (Transmitter)
  4. සංඥාව (Signal)
  5. බාධක (Noise)
  6. ග්‍රාහකයා (Receiver)
  7. සන්දේශ අන්තය (Destination)

- තොරතුරු මූලාශ්‍රය හෙවත් සන්නිවේදකයා ලබා ගන්නා සන්දේශය තාක්ෂණික ක්‍රියාදමයකට යටත් වී කටහඬ විද්‍යුත් සංඥා බවට පරිවර්තනය කරයි.


- මෙහි දී සන්දේශය විකාශය කළ හැකි සංඥ බවට පත් කර ග්‍රාහකයා වෙත ඉදිරිපත් වේ. සංඥ, සංකේතවලින් හෙබි සන්දේශය මාධ්‍යයක් හරහා ගමන් කිරීමේ දී විවිධ බාධක තත්ත්වයන්ට ලක් වේ. ඒවා අර්ථ බාධා (Semantic Noise) මෙන් ම නාලීය බාධා (Channel Noise) විය හැකි ය.

- මෙම ආකෘතියේ විශේෂතා

  1. රේඛීය ආකෘතියක් වීම
  2. සන්නිවේදනයට බලපාන බාධක තත්ත්වයන් පිළිබඳ ව මුල් වරට අදහස් ඉදිරිපත් කිරීම
  3. ප්‍රතිපෝෂණය පිළිබඳ ව අවධානය යොමු නොකිරීම
  4. සම්ප්‍රේෂණ හා ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය විග්‍රහ කිරීම
  5. තාක්‍ෂණික දෘෂ්ටිකෝණයකින් සන්නිවේදන ක්‍රියාවලිය විමසා බැලීම

**4. ඔස්ගුඩ් ශ්‍රාම් ආකෘතිය**

- විල්බර් ශ්‍රාම් (1907- 1987) හා චාර්ල්ස් ඔස්ගුඩ් (1933 උපත ලබා ඇත.) විසින් මෙම සන්නිවේදන ආකෘතිය 1954 දී හඳුන්වා දී ඇත. මෙම විද්වතුන් දෙදෙනා සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රයට සම්බන්ධ අය වන නිසා සන්නිවේදන ක්‍රියාවලිය පිළිබඳ සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් විග්‍රහ කර තිබේ.




- මෙම ආකෘතියේ සන්නිවේදකයා ආකේතකරය ලෙසත් ග්‍රාහකයා විකේතකරය ලෙසත් දක්වා ඇත. සන්නිවේදකයාට හා ග්‍රාහකයාට ලැබෙන සන්දේශය ඔවුන් විසින් අර්ථ කථනය කර ගනියි.

- සන්දේශය මඟින් සන්නිවේදකයා සහ ග්‍රාහකයා අතර සම්බන්ධතාව ගොඩනගන අතර එම භූමිකා හුවමාරු වෙමින් සන්නිවේදන ක්‍රියාවලිය අඛණ්ඩ ව සිදු වේ.

- ඒ අනුව සන්නිවේදන ක්‍රියාවලිය එක් තැනකින් ආරම්භ වී තවත් තැනකින් අවසන් නො වී චක්‍රීය ව ගමන් කරන බව ශ්‍රාම් ඔස්ගුඩ් මෙම අවස්ථාවෙන් පෙන්වා දෙයි.

- මෙම ආකෘතියේ විශේෂතා

1. මෙය රේඛීය නොවන චක්‍රීය සන්නිවේදන ආකෘතියකි.
2. සන්නිවේදකයා සේ ම ග්‍රාහකයා ද සන්නිවේදනයට වැදගත් වේ.
3. ආකේතකරණය, විකේතකරණය, අර්ථකථනය යන අවස්ථා පැහැදිලි කර තිබීම
4. සන්නිවේදනය අඛණ්ඩ ක්‍රියාවලියක් බව
5. ප්‍රතිපෝෂණය යන්න ද මෙයට අන්තර්ගත කර තිබේ.

**ඇගයීම**

1. සන්නිවේදන ආකෘති පිළිබඳ උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

2. පුද්ගලාන්තර සන්නිවේදන අවස්ථාවක් තෝරා ගන්න. ඔබ තෝරාගත් එම අවස්ථාව කැමති ආකෘති දෙකක් යොදා ගෙන විග්‍රහ කරන්න.

**පාරිභාෂික පද**

| | | |
|---|---|---|
| අතථ්‍ය සන්නිවේදනය | - | Vertual communication |
| අන්තර් පුද්ගල සන්නිවේදනය | - | Intger personal communication |
| අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය | - | Intrapersonal communication |
| කථන සන්නිවේදනය | - | Oral communication |
| ජන සන්නිවේදනය | - | Mass communication |
| දෘශ්‍ය සන්නිවේදනය | - | Visual communication |
| නිර්වාචික සන්නිවේදනය | - | Nonverbal communication |
| මහජන සන්නිවේදනය | - | Public communication |
| ලිඛිත සන්නිවේදනය | - | Written communication |
| වාචික සන්නිවේදනය | - | Verbal communication |
| සන්නිවේදන ආකෘති | - | Models of communication |
| සන්නිවේදන වර්ග | - | Types of communication |
| සන්නිවේදන ස්වරූප | - | Forms of communication |
| සමූහ සන්නිවේදනය | - | Group communication |
| ශ්‍රව්‍ය සන්නිවේදනය | - | Audio communication |

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

1. දිසානායක, විමල්, මානව සන්නිවේදනය, ලේක් හවුස් සමාගම, කොළඹ, 1977
2. Berger,Charles R., Interpesonal Communication: The International Encyclopedia of Communication, New York, Wiley Blackwell, 2008
3. Bittner, John R. Mass Communication: An Introduction, U.S.A, 1986
4. Charles, Wright R., Mass Communication, New York, 1971
5. DeFleur and Dennis, Understanding Mass Communication, 7th Edition, U.S.A, 2002
6. Domimic, Joseph, R., The Dynamics of Mass Communication, 10th Edition, New York,2010
7. James Waston and Anne Hill, A Dictionary of Communication and Media Studies, India, Universal book stall, 1991
8. MacBride Sean, Many Voices, One World, United Nations Educational, Scientific and Cultural Organization,New York, 1980
9. Murphy, Herta A.,Herbert W. Hildebrandt, and Thomas Jane P.,Effective Busines Commu nications,7th edition, Mc Graw - Hill, 1997
10. Stewart L.,Tubbs and Moss Sylvia,Human Communication,7th Edition,Singapore,1994